# හෝමාගම ප්‍රාදේශීය සභාව
# කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 15 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකල එකතු වටිනාකම රු.53,879,529 ක් වූ ප්‍රජාශාලා, ආදාහනාගාර, මාතෘ සායන හා කාර්යාල ගොඩනැගිලිවල ඉදිකිරීම් පිරිවැය ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) වර්ෂ 20 කට වඩා පැරණි හා පෙර වර්ෂවලදී වෙන්දේසි කරන ලද වටිනාකම රු.7,539,576 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත හා ලී බඩු සවිකිරීම්වල භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමකින් තොරව ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද විකුණුම් වටිනාකම රු.227,750 ක් වූ භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ලබාගත් කායවර්ධන උපකරණ වෙනුවෙන් ගෙවිය යුතු රු.9,706,300 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) භෞතිකව නොමැති රු.5,502,619 ක් වටිනා ගබඩා භාණ්ඩ, ගබඩා තොග වශයෙන් තොග ගිණුමෙහි සටහන් කර තිබුණි.

(ඊ) සභා භූමිය තුල පිහිටි ලේඛනාගාර ගොඩනැගිල්ලට 2015 මාර්තු 25 දින ගින්නෙන් සිදු වූ අලාභය රු.1,202,867ක් ලෙස තක්සේරු කර තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්
-------------------------

බාහිර පාර්ශවයන් විසින් සභාවට විරුද්ධව වටිනාකම රු.32,500 ක් වූ නඩු 05 ක් පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි සටහනක් ලෙස හෙළිදරව් කරනොතිබුණි.

1.3.3 නොසැසඳුනු ගිණුම්

------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 08ක ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී පොත්/උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.16,553,734 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ලැබිය යුතු ගිණුම්

---------------------

(අ) 2017 වර්ෂයට අදාලව ලැබිය යුතු රු.209,142 ක හිඟ වැටුප් 2018 සැප්තැම්බර් වනවිටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන භාරකාර මණ්ඩලය වෙත රු.300,000 ක වාර්ෂික බදු කුලියකට පවරා තිබූ අක්කර 01 රූඩ් 02 පර්චස් 10 ක ප්‍රමාණයකින් යුත් ඉඩම් කොටස සඳහා 2013 වර්ෂයේදීකර තිබූ රු.900,000 ක් වූ නව තක්සේරු මුදල නොලැබීම හේතුවෙන් 2014, 2015, 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ බදු මුදල රු.2,700,000 ක් විය.

1.3.5 අනුකූල නොවීම්

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| (අ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | - | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත් සභාව විසින් වසර 07 කට පෙර ලබා ගත් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. |
| (ආ) චක්‍රලේඛ හා ලිපි | | |
| (i) 1985 මාර්තු 20 දිනැති ලිපි අංක දෙසැ/01 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | 4,838,218 | බිම් පරිමාණ අනුපාතය ඉක්මවීම,අනවසර ඉදිකිරීම් සහ රථ වාහන නතර කිරීම වෙනුවෙන් අයකරන සේවා ගාස්තුවලින් සියයට 25ක් නාගරික සංවර්ධන අධිකාරියට යවා නොතිබුණි. |
| (ii) 1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 15 | 19,352,872 | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින මුදල් හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.122,213,348 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.124,665,116 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

#### 2.2.2 වරිපනම් හා බදු

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කල ආදායම | 2017 දෙසැ.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කල ආදායම | 2016 දෙසැ.31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 53,926,700 | 71,670,580 | 76,151,369 | 29,688,575 | 5,326,700 | 52,746,452 | 65,708,626 | 33,717,640 |
| (ii) කුලී | 12,618,791 | 11,502,847 | 11,861,422 | 393,302 | 12,618,791 | 13,368,675 | 13,996,329 | 739,620 |
| (iii) බලපත්‍ර ගාස්තු | 6,000,900 | 4,906,274 | 5,000,928 | - | 2,500,000 | 5,291,041 | 5,291,041 | - |
| (iv) වෙනත් ආදායම් | 381,735,026 | 244,922,680 | 376,228,139 | 162,665,062 | 2,936,947,108 | 249,250,437 | 300,518,503 | 247,496,949 |

##### වරිපනම්

2017 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු වරිපනම් රු.29,610,616 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| හිඟය අදාල කාල සීමාව | හෝමාගම උපකාර්යාලය | වැතර උපකාර්යාලය | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අවු.01 ට අඩු | 4,051,839 | 2,186,541 | 6,238,380 |
| අවු.1-3 අතර | 5,452,004 | 9,117,713 | 14,569,717 |
| අවු.3-5 අතර | 1,190,338 | 3,376,810 | 4,567,148 |
| අවු.5ට වැඩි | 2,476,274 | 1,759,097 | 4,235,371 |
| | 13,170,455 | 16,440,161 | 29,610,616 |

2.2.3 කුලී

-----

කඩකුලී

----------

(අ) අවුරුදු 03 කට වැඩි කාලයක සිට පවතින රු.45,419 ක හිඟ මස්කඩ කුලී ආදායම තැන්පත් මුදලින් අයකර ඇතත්, එය මෙතෙක් ආදායමට ගෙන නොතිබුණි.

(ආ) සුභ සාධක සංගම්, ප්‍රජාශාලා, බැංකු හා උපතැපැල් කාර්යාල ආදී සේවා සපයන ආයතන සඳහා ලබා දී ඇති සභාව සතු ගොඩනැගිලි ද කඩකුලී ලේඛනයේම පවත්වා ගෙන ගොස් තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ රු.87,388,797 ක් හා මුද්දර ගාස්තු රු.75,011,833 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත්, පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරනය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළ යුතුව තිබු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමු කර්තව්‍යයන්

--------------------------------

සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල ඇස්තමේන්තුගත වටිනාකම රු.1,155,000 ක් වූ කර්මාන්ත 03 ක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභාව විසින් එකතු කරන කසළ, කරදියාන කසළ අංගනය වෙත ප්‍රවාහනය කිරීම සඳහා 2016 වර්ෂයේ මිල ගණන් කැඳවීමට අනුව අවම මිල ඉදිරිපත් කළ ආයතනයට එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය පරිදි පාලන කමිටුව තිරණය කර තිබු අතර, මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය කෙරේ.

(i) මෙම ආයතනය 2016 වර්ෂයේ කසළ ප්‍රවාහනය සිදුකර තිබු අතර කසළ ප්‍රවාහනයේදි සිදු කරන ලද අක්‍රමිකතාවක් හේතුවෙන් රු.2,491,031 ක පාඩුවක් සභාවට සිදුකර ඇති බව විමර්ෂන වාර්තාවලට අනුව අනාවරණය විය.

(ii) 2017 වර්ෂයේ කසළ ප්‍රවාහනය සඳහා ද මෙම ආයතනයටම කොන්ත්‍රාත්තුව පවරා තිබූ අතර එම වර්ෂය තුලදී ද විවිධ අක්‍රමිකතා සිදුකර ඇති බවට අධීක්ෂකයින් විසින් පැමිණිලි කර තිබුණි.

(iii) දෙපාර්ශවය අතර 2017 මාර්තු 01 දින සිට 2018 මාර්තු 01 දින දක්වා එළඹී ගිවිසුම 2018 ජනවාරි සිට අවලංගු කර කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීම නිසා කොන්ත්‍රාත්කරු විසින් සභාවට විරුද්ධව අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර තිබු අතර මෙතෙක් එම නඩුව අවසන්ව නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

-----------------------------------

ද්විතියික මට්ටමේ තාක්ෂණ නිලධාරි, පුස්තකාලයාධිපති, ආදායම් පරීක්ෂක, පෙර පාසැල් ගුරු, තනතුරු 01 බැගින් පුරප්පාඩුව පැවති අතර ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 17 ක් හා අතිරික්ත 01 ක් විය.

(ආ) සේවක ණය

--------------

2017 දෙසැම්බර් 31 ට අයවිය යුතු සේවක ණය ශේෂය රු.23,038,556 ක් වූ අතර එම ශේෂය තුල තොරතුරු සොයාගත නොහැකි සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.53,981 ක් හා විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා සේවය අත්හිටුවා ඇති සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.369,727 ක් විය.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

------------------------------------

කායවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා කායවර්ධන උපකරණ මිලදී ගැනීමට මිල ගණන් කැඳවා තිබුණු අතර ආයතන 03 කින් මිල ගණන් ලැබී තිබුණි. යුරෝපයේ නිෂ්පාදිත උපකරණ බැව් දක්වමින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත රු.9,706,300 ක් වූ වැඩි මිල ටෙන්ඩරය පිළිගෙන තිබුණි. මේ අනුව රු.3,703,260ක් වූ අඩු මිල ටෙන්ඩරය හා වැඩි මිල ටෙන්ඩරය අතර වෙනස රු.6,003,040 ක් විය. එසේ වුවද මෙම උපකරණ යුරෝපයේ (ස්පාඤ්ඤයේ) නිෂ්පාදිත බැව් තහවුරු කිරීම සඳහා සහතිකයක් ඉදිරිපත්කර නොතිබුණු අතර මෙම කිසිඳු උපකරණයක නිෂ්පාදිත රට හෝ අනුක්‍රමික අංකයක් සඳහන් වී නොතිබුණි. එමෙන්ම මෙම භාණ්ඩ ආනයනය කරනු ලබන්නේ චීනයෙන් හා තායිවානයෙන් බැව් රේගුවෙන් ලබාගත් තොරතුරුවලින් තහවුරු විය.

**3.4** වත්කම් කළමනාකරණය

-------------------------------

**3.4.**1 වත්කම් ලේඛනගත නොකිරීම.

-------------------------------------

(අ) සභාවට අයත් ඉඩම් කට්ටි 18 ක් සඳහා වූ ඔප්පු අස්ථානගත වී තිබුණි.

(ආ) වැතර උපකාර්යාලයේ බඩු වට්ටෝරු පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, සාමාන්‍ය පුටු 46ක්, වානේ අල්මාරි 17 ක් පරිගණක 03 ක් සහ ගණකයන්ත්‍ර 12ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණි.

3.4.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වටිනාකමක් හඳුනාගත නොහැකි විදුලි ජනන යන්ත්‍රයක් දිරාපත් වෙමින් පැවතුණි.

3.5 හඳුනාගත් පාඩු

-------------------

ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ තිබූ රු.111,985 ක් වටිනා කොඩි කණු 113 ක ඌනතාවයක් තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------------

අයවැය පාලනය

--------------------

(අ) වැය විෂයයන් 95 ක් සඳහා සලසා තිබූ එකතුව රු.10,422,200 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 39 ක් වෙනුවෙන් රු.3,864,500 ක් වෙන්කර තිබුණද එයින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් වැයකර නොතිබූ අතර එම ප්‍රමාණය රු.3,475,039 ක් විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් පොත් පත් හා ලේඛන යාවත් කාලීනව නොපැවැත්වීම. |
| (ආ) | වත්කම් / දේපළ | i. ලේඛනගත නොකිරීම. |
| | | ii. ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | තොග ලේඛනගත නොකිරීම. |